# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2024.12.22 පැය 1120 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1873/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.12.21 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

02.

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 200 | 695 | බැරල් 03<br>තඹ දඟර 05 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.12.21 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කුඩාබුත්ගමුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 817 මිලි ග්‍රෑම් 800 ක්, විද්‍යුත් තරාදියක් හා ජංගම දුරකථනයක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.12.21 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඳාන පොලිස් වසමේ වික්ටර් ඒකනායක වත්ත, මීගමුව පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 530 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කඳාන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ කඳාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඳාන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුර.

2024.12.21 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අම්බලන්තොට පොලිස් වසමේ නෝනගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්තොට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අම්බලන්තොට පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර

2024.12.21 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අරලගංවිල පොලිස් වසමේ මහ දමන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත බෙහෙත් කොටන තුවක්කුවක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** අරලගංවිල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 62 ක් වූ මහදමන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අරලගංවිල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර

2024.12.21 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුල්මුඩේ පොලිස් වසමේ නාවෙරයිගාන්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුල්මුඩේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 07. පුරාවස්තු කැණීම් කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.

2024.12.21 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කිලිනොච්චිය පොලිස් වසමේ කනකපුරම් ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **පුරා වස්තූන් ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු ස්කෑනර් යන්ත්‍රයක් ද සමඟ** අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 ත් 53 අතර වයස්වල පසුවන බලංගොඩ, ගලෙන්බිදුනුවැව, අම්පාර, වව්නියාව හා වේයන්ගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කිලිනොච්චිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**